183

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන- 2022/2023

6 වන මට්ටම

අවසාන පරීක්ෂණය

**EPU6231 - ප්‍රාථමික පාසල් සැකසුම් තුළ මාර්ගෝපදේශනය සහ උපදේශනය.**

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2024.03.17 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 - වන කොටස

01. "ඕනෑම ගුරුවරයෙකුට මාර්ගෝපදේශනය ලබා දිය හැකි වුවත් උපදේශනය ලබාදිය නොහැක." ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුර සනාථ කරන්න.

02. මාර්ගෝපදේශන හා උපදේශන සේවා පාසල් පද්ධතිය තුල අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමෙන් ඇති ප්‍රයෝජන තුනක් (03) සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. පාසලක උපදේශන ගුරුවරයෙකුගේ කාර්යභාරය කෙටියෙන් විභාග කරන්න.

04. මනෝ විශ්ලේෂණ න්‍යායට අනුව පුද්ගලයන්ට මනෝවිද්‍යාත්මක ගැටළු ඇති වන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

05. සමායෝගී ගැටළු, ළමයින්ගේ සමාජ සංවර්ධනය කෙරෙහි ඇති කරන ඍණාත්මක බලපෑම් තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. පාසල් මාර්ගෝපදේශ සේවයේ සහ උපදේශන සේවයේ ක්‍රියාත්මක වන පසු විපරම් කිරීමේ ක්‍රියාවලියේ වාසි තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

07. උපදේශනයේදී වැදගත් වන සච්චාරිත්‍ර ධර්ම හතර (04) සඳහන් කරන්න.

08. සුහග දුර්වල සාධනයක් සහිත ළමුන්ගේ ප්‍රධාන ලක්ෂණ තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 8 X 5 = 40)

## 02- කොටස

09. (i.) ප්‍රාථමික පාසල් සිසුන්ගේ සමායෝගී ගැටළු වලට බලපෑ හැකි පාසල් ආශ්‍රිත සාධක **හතරක් (04)** පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) ප්‍රාථමික පාසල් සිසුන් තුළ පවතින සමායෝගී ගැටළු අවම කිරීමට ගුරුවරයෙකු වශයෙන් ඔබට ගත හැකි ක්‍රියා මාර්ග **හතරක් (04)** පැහැදිළි කරන්න. (ලකුණු - 10)

10. (i.) ප්‍රාථමික සිසුන්ගේ හැසිරීම් අක්‍රමතා සඳහා හේතු විය හැකි සාධක **හතරක් 04** පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) ඉන් එක සාධකයක් ඔවුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි කෙසේ බලපෑ හැකිදැයි කරුණු **හතරක් (04)** දක්වමින් විස්තර කරන්න. (ලකුණු - 10)

11. (i.) "සංඛ්‍යාලේඛන දත්ත සනාථ කරන්නේ පාසල් ජනගහනයේ 10% ක් පමණ සිසුන් මානසික සෞඛ්‍ය ගැටලු සමඟ අරගල කරන බවයි."
ඉහත ප්‍රකාශයට අනුව එම තත්ත්වයට බලපෑ හැකි කරුණු තුනක් **(03)** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු - 10)

(ii.) "ඕනෑම පුද්ගලයෙකුට ජීවිතයේ ඕනෑම අවස්ථාවක උපදේශනය අවශ්‍ය විය හැක."
ඉහත ප්‍රකාශය සමඟ ඔබ **එකඟද?** ඔබගේ පිළිතුර සාධාරණීකරණය කරන්න.
(ලකුණු - 10)

12. (i.) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් ළමුන් මුහුණ දෙන අධ්‍යාපනික ගැටළු **පහක් (05)** සඳහන් කරන්න. (ලකුණු - 05)

(ii.) ඉන් එක ගැටළුවක් තෝරාගෙන ළමයාට එය විසඳා ගැනීම සඳහා පාසලට හා ගුරුවරයාට මාර්ගෝපදේශන හා උපදේශන සේවා සහය සැලසිය හැක්කේ කෙසේදැයි දක්වන්න.
(ලකුණු - 15)

13. (i.) මාර්ගෝපදේශන සහ උපදේශන සේවාව වර්තමාන පාසලට අවශ්‍ය වන්නේ ඇයිද යන්නට පහත සඳහන් අංශ තුන (03) සඳහා කරුණු **තුන (03)** බැගින් හේතු විස්තර කරන්න.

අ. පවුල
ආ. පාසල
ඇ. සමාජය (ලකුණු - 10)

(ii.) උපදේශකවරයෙකු සතු වෘත්තීය වගකීම් **පහක් (05)** උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.
(ලකුණු - 10)

- සියලුම හිමිකම් ඇවිරිණි. -